# 07 රජකුමරියකගේ දෛවය

ජනකතා යනු අපේ මුතුන් මිත්තන්ගේ ඥාන සම්භාරය බහා ලූ මංජුසාවක් වැනි ය. ඈත අතීතයේ සිට ගලා එන හර පද්ධති, සිරිත් විරිත්, සමාජ රටා ආදිය අවබෝධ කර ගැනීම සඳහා ජනකතා ඉවහල් වෙයි. සරල වූත්, අව්‍යාජ වූත් ගැමියාගේ හුදෙකලා ජීවිතයට සමීප වූ කතා කලාවකි ජනකතා. අපේ මුතුන් මිත්තන් තම දූ දරුවන්ට ජනකතා කියා දීමෙන් කළේ සමාජ හරයන් සියුම් ලෙස ජන මනසට සමීප කිරීම යි. මේ ජනකතා කියවීමෙන් ළමා සිතේ වින්දනයක් ජනිත වන අතර ළමයාට ජීවිතය පිළිබඳ අවබෝධයක් ද ලැබේ. මෙහි දැක්වෙන්නේ ජීවිතයේ අභියෝගවලට මනා ඉවසීමෙන් යුතු ව මුහුණ දුන් කුමාරිකාවක සම්බන්ධ කතා පුවතකි. මෙම ජනකතාව ඒ. පී. ගුණරත්න මහතාගේ **රන්මුතු දූව සහ තවත් ජනකතා** නම් ග්‍රන්ථයෙන් උපුටා ගත්තකි.



එකමත් එක කාලෙක එකමත් එක රටක හිටියා රජකෙනෙක්. මේ රජ්ජුරුවන්ට හිටියා එක දූ කුමාරිකාවක්. මේ කුමාරි බොහොම ලස්සනයි. ඉතින් මේ කුමාරි තමන්ගේ රූප සෝබාව ගැන බොහොම ආඩම්බරයි. අහංකාරයි. ඉතින් මේ දුවගෙ අහංකාරකම පිය රජ්ජුරුවන්ට කරදරයක් වුණා. මොකද මේ කුමරිට සරණ මංගල්ලයක් කරලා දෙන්ඩ හැටියක් නෑ.

ඉතින් මේ කුමාරිව සරණ අහගෙන එක එක රටවලින් රාජකුමාරවරු ආවා. ඇමතිකුමාරවරු ආවා. ඉතින් මේ කවුරු ආවත් මේ කුමාරි නෙමෙයි එයාව පිළිගන්නෙ. මෙයා මොකද කරන්නෙ රන් රුවන් ආබරණ පැළඳගෙන රුවට පටසළු පොරවාගෙන ඇවිත් බලලා කොහොම නමුත් ඒ කුමාරයන්ගෙ ඇදයක් හොයාගෙන ''කැමති නැහැ'' කියනවා. ඔහොම යන අතරෙ එක දවසක් වෙන රටක යුවරජ්ජුරු කෙනෙක් ආවා කුමාරිට සරණ අහගෙන. මේ යුව රජ්ජුරුවන්ගෙ ඒම ගැන මහ රජ්ජුරුවොත් බොහොම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සන්තෝස වුණා. ඒ වුණාට මේ කුමාරි එයාගෙ තියෙන අහංකාරකමට "ඔය මහ රැවුළක් තියෙන මිනිහා මට එපා" කියලා කීවා.



මේ කාලෙ මහ රැවුළක් තියෙන එක නරකක් නෙමෙයි. හොඳයි. මොකද වැදගත් උදවිය කාටත් එතකොට රැවුළ තිබුණා. ඉතින් මේ කුමාරිගෙ කතාවට රජ්ජුරුවන්ට තරහා ගියා. රජ්ජුරුවො කුමාරි ගැන කලකිරිලා ඉවස ඉවසා තමයි හිටියෙ. ඉතින් මේ වර හොඳට ම තරහ ගිහින් කීවා, "මේ හුරතලේ තවත් දිගට ගෙනියන්ඩ බෑ හෙට මේ මාලිගාවට ඉස්සර වෙලා ම ආපු හිඟන්නාට කුමාරි ව දෙනවා" කියලා. යුව රජ්ජුරුවොත් මේ කතාව අහගෙන.

ඉතින් මේ යුව රජ්ජුරුවො පහුවදා උදේ ම හිඟන්නෙකු වගේ හැරහිලා ඇවිත් කවියක් කියලා හිඟමනක් ඉල්ලුවා. එතකොට රජ්ජුරුවො තමන් දිවුරා කියා තුබුණ හැටියට මේ කුමාරි හරහලා අර හිඟන්නාට පාවා දුන්නා. ඉතින් මේ වෙච්ච නස්පැත්තිය මොකක් ද කියලා අර කුමාරි අඬන්න වැලපෙන්ඩ පටන් ගත්තා. පිය රජ්ජුරුවන්ට නොයෙක් විදිහෙන් යාඥා කෙරුවා. ඒත් රජ්ජුරුවො කියාපු වචනෙ කඩ කරන්නෙ නැතුව හිඟන්නාට කීවා "නුඹේ භාර්යාව කීකරු කරගෙන එක්ක යාම උඹට අයිති වැඩක්" කියලා.

ඉතින් මේ හිඟන්නා අර කුමාරි එක්ක නුවරින් පිට වෙලා ගිහින් මහ වනේකට ඇතුළු වුණා. වනේ දිගට යනවා යනවා කුමාරිට යන්ඩත් වෙහෙසයි. ඉතින් හිඟන්නාගෙන් ඇහුවා ''මේ වනේ ඉවරයක් නැද්ද'', කාගෙද මේ වනේ කියලා ඉතින් හිඟන්නා කීවා මේ රටේ යුව රජ්ජුරුවන්ගෙ වනේ මේක" කියලා. ඉතින් ඔන්න වනේ ඉවර වෙලා මහ කැලෑවකට වැටුණා. ඒකත් අර වගේ ඉවරයක් නැති කැලෑවක්. ඒ ගමන කුමාරි ඇහැව්වා

"කාගෙද මේ කැලෑව?" කියලා. එතෙන්දිත් හිඟන්නා කීවා "මේ කැලෑවත් යුව රජ්ජුරුවන්ගේ" කියලා.

ඉතින් මේ කුමාරි කල්පනා කෙරුවා, අනේ මං වගේ මෝඩියෙක්. මං අර යුවරජ්ජුරුවන් එක්ක ගියා නම් මොකද? කියලා. ඉතින් ඔය කැලෑව පහු කරලා ගියා ම අපූරු උයනකට පැමිණුනා. නොයෙක් නොයෙක් ජාතිවල මල් පලතුරු පිළිවෙළකට වවා තුබුණු මේ උයන හැබෑ ම අලංකාරයි. ඉතින් එතෙන්දි කුමාරි ඇහුවා "කාගෙද මේ අපූරු උයන" කියලා. ඒ උයනත් යුව රජ්ජුරුවන්ගෙ. ඒ ගමන මේ කුමාරි කීවා "අනේ මම මොන තරම් කාලකණ්ණි එකියක් ද? මේ වගේ සම්පතුත් මම අත් ඇරියනේ" කියලා. එතකොට හිඟන්නා කීවා "දැන් නුඹට ඔය කාගෙවත් දේ ගැන හිතන්ඩ අයිතියක් නෑ. මා හිඟන්නෙකු වුණත් උඹ මගේ බාරියාව. ඒක හින්ද උඹ හිතාපන් මගෙ පැල්පත ගැන" කියලා කුඩා පැල්පතක් ගාවට එක්ක ගියා. පැල්පත හොඳට ම හැඩි වෙලා තිබුණා. ඉතින් හිඟන්නා කීවා ''මේක තමයි අපේ ගෙදර. දැන් ඉතින් මේක සුද්ද පවිත්තර කර ගන්න ඕනෑ. ගෙදර සුද්ද පවිත්තර කර ගන්න එක ගෑනිට අයිති වැඩක්" කියලා.

ඉතින් මේ කුමාරි අහංකාරකමට හිටියාට ගෙයක්, මිදුලක්වත් අතුගාන්ටවත් දැනගෙන හිටියා යැ. ඉතින් එයා ගේ දිහා බලලා හූල්ලැවා. එතකොට හිඟන්නා කීවා "හූල්ලලා වැඩක් නෑ. මිනිසුන් වුණා ම සැප දුක් දෙක ම අයිතියි. දන්නෙ නැතුවාට මොකද දුකත් සැප තරමට හොඳ දෙයක්. හා, ඉතින් මේ පැමිණි දුක් පැණි රසයි කියලා, ගේත්, මිදුලත් අතුගාලා ගෙය එකලසක් කරමු" කියලා. ඉතින් මේ කුමාරිත් දෑසේ කඳුළු පුරවාගෙන ගෙදර සුද්ද පවිත්තර කෙරුවා. ඒ අතර හිඟන්නා කඩපිලට ගිහින් උයන පිහන දේ ඇරගෙන ආවා. උයන පිහන දේ ගෙනාවට කුමාරි දන්නවායැ උයාගෙන කන්ඩ. ඉතින් එයාට ඒ ඒ වැඩ කරන හැටි කියා දිදී හිඟන්නාත් වැඩට අත්උදව් දුන්නා.

ඉතින් මේ අහංකාරකමට හිටපු කුමාරි ළිඳට ගිහින් දිය ගෙනත් තියලා, ගේ වටේ ඇවිදලා දර තුරුල්ලක් කඩාගෙන ඇවිත්, හාල් ටික ගරන්ඩ පටන් ගත්තා. ඒ අතර හිඟන්නා වෙලට ගිහින් පලා ටිකකුත් නෙළාගෙන ආවා. ඉතින් මේ කුමාරි හාල් ගරනවාට වැඩියෙන් කඳුළු පෙරනවා. හොටු හූරනවා. මොකද දුකේ බැරුව.

ඉතින් ඒ වෙලාවෙ හිඟන්නා කීවා "තමන්ගෙ බත තමන් උයා පිහාගෙන කෑම මදිකමක්වත්, අවනම්බුවක්වත් නෙවෙයි. ඒක තමා නම්බුව. කුමාරියක් නෙමේ මහේසිකාවක් වුණත් උයන පිහින හැටි දැන ගන්ඩ ඕනෑ කියලා. ඉතින් කොහොම හරි දෙන්නා එක්ක එකතුවෙලා බත් මාළු උයලා රෑට බත් කෑවා. කාලා ඒ දුප්පත් පැල්මැසිය උඩ බුදියා ගත්තා. ඉතින් උදේ කාක්කා අඬනකොට හිඟන්නා කුමාරි අවදි කරවලා කීවා කැඳට හාල් ටික ළිපේ තියලා ගෙවල් මිදුල් අතුගා දමන්ඩ කියලා. ඉතින් ඔය විධිහට කුමාරි ගෙදරදෙරේ වැඩට හුරු වුණා.

ඉතින් එක දවසක් හිඟන්නා කීවා, මම අමාරුවෙන් ජීවත් වුණ හිඟන්නෙක්. දැන් අපි දෙන්නෙක් වුණා. ගෙදරට ගෙනාපු කන බොන දේ ඉක්මනින් ඉවර වෙනවා. ඉතින් ආයෙ ඒවා ගේන්ඩ මුදල් ඕනෑ. ලොකු දෙයක් බැරිනම් වට්ටිපෙට්ටි ටිකක් හරි වියාපල්ලා සල්පිලට ගිහින් විකුණා ගන්ට කියලා. හිඟන්නා පන් මිටියක් ගෙනත්, දුන්නා ම කුමාරි හිඟන්නාගෙන් අහගෙන පෙට්ටි වියමන කරන්ට වුණා. ඒත් අත් පුරුදු නැතුව ඒ ළපටි අත්වල ඇඟිලි පුපුරලා ඉදිමිලා වේදනා ඇති කරන්ඩ වුණා. ඉතින් කුමාරි අඬනවා. එතකොට අර හිඟන්නා කීවා"මොකක් ද දෙවියනේ මා මේ කර ගත්ත විපත්තිය. මිනිහෙකු සඟේ ගන්ට ඕනෑ තමන්ට සහයක් වෙන්ට පුළුවන් එකියක නේ. තමන්ගෙ ජීවිකාව ගෙනියන්ඩ තරමටවත් වැඩක් කරන්ඩ බැරි ගෑනියකගෙන් මොකක් ද ඇති කාරිය" එතකොටයි කුමාරිට තේරුණේ තමන් අප්පොච්චිගෙ පුළුවන්කාරකම් හිතට අරන් මහ අහංකාරකම් පෙන්නුවාට තමන්ගෙ කිසි වටිනාකමක් නැහැ නේ කියලා.

ඉතින් එතකොට හිඟන්නා කීවා,"හොඳයි අතපය වෙහෙසවෙලා වැඩක් කරන්ඩ පුළුවන් කමක් නැත්නම් එච්චර වෙහෙසෙන්ඩ වෙන්නෙ නැති කාරියක් මම කියන්නම්. මම ගෙනත් දෙන්නම් වළං ටිකක්. ඒක සල්පිලේ ගිහින් තියාගෙන විකුණලා එයින්වත් ලාභයක් ලබා ගන්ඩ බලමු" කියලා. ඉතින් එහෙම කියලා හිඟන්නා ගෙනාවා වළං කදක්. ඉතින් ඒකටත් කුමාරි මැසිවිලි කියන්න පටන් ගත්තා. "මා කොහොම ද සල්පිලේ බඩු තියාගෙන වෙළෙඳාම් කරන්නේ. අපේ ඇමතිවරු දැක්කා ම මා ගැන මොනවා නො හිතයි ද? දන්නා අඳුනන මිනිස්සු මට හිනා වෙයිනෙ" කියලා. ඉතින් හිඟන්නා කීවා " ඒ හිනා වෙන මිනිසුන් එකෙකුත් නෑ අපේ ජීවිකාව සලස්සල දෙන්නෙ. ඒක අප ම කරගන්ඩ ඕනෑ. නැත්නම් අපට බඩගින්නේ මැරෙන්ඩ වෙයි" කියලා. කුමාරිගෙ අකැමැත්තෙන් ම ඈ කැටුව ගිහින් සල්පිලට වළං කදත් පැත්තකින් තියලා කීවා "ඊට සුදුසු තැනකින්, හොඳ හැටියකට තියාගෙන වෙළෙඳම කරන්ඩ" කියලා හිඟන්නා වෙන වැඩකට ගියා.

ඉතින් මේ කුමාරි දන්න වෙළෙඳාමක් තියෙනවයැ. ඒක හින්දැ වළං ටික මග අයිනෙ තියාගෙන පැත්තකට වෙලා බලාගෙන හිටියා. ඔය වෙලාවට හේවායෙක් අශ්වයකු පිටේ ඇවිත් එතන කලබලයක් කරලා අර වළං ටික බිඳල දමලා ගියා. ඉතින් මේ කුමාරි හොඳට ම බය වෙලා කරගන්ඩ දෙයක් නැතුව අඬ අඬා ගිහින් සුවාමිපුත්තරයාට කීවා වෙච්ච සිද්දිය. ඉතින් හිඟන්නා අර බය වෙච්ච කුමාරි තවත් බය වද්දන්නෙ නැතුව ආදරෙන් කීවා "කමක් නෑ සොඳුර ඒ අපේ වාසනාවෙ හැටි තමා. ඉතින් ඒ වුණාට මේ කාරණා හිතට ගන්ඩ හොඳා. බොහෝ දෙනා යන මග අහල වළං වගේ කැඩෙන බිඳෙන දෙයක් තියාගෙන ඉන්න මිනිහා ඒක කරන්ඩ ඕනෑ අරපරිස්සමට. ඕක දැනගන්ඩ මහ නුවණක් ඕනෑ කරන්නේ නෑ. සිහි මොළේ තියෙන්න ඕනෑ. එච්චරයි" කියලා. ඉතින් එතකොට කුමාරිට බොහොම ලැජ්ජා හිතුණා. ''මම අනුන්ගෙ බල පුළුවන්කාරකම් හිතට අරගෙන අහංකාරකම් කළාට මොකද මට තියෙන බල පුළුවන්කාරකම වළඳක් පරෙස්සමට තියාගන්න බැරි ගෑනි" කියලා.

ඉතින් ඒ ගමන හිඟන්නා කීවා "දැන් ඉතින් ගිය හකුරට අඬලා වැඩක් නෑ, තියෙන හකුරක් රැකගන්න එකයි ඇත්තෙ. උඹලට වෙළෙඳාමක් කරන්ඩ දක්ෂකමක් නෑ. මං හොයලා බලන්නම් කුලියක් මලියක් ලැබෙන තැනක වැඩක්වත් හොයාගන්ඩ" කියලා. ඉතින් ඒ අතර කුමාරි තනියම ඉඳගෙන තමන් ගැන ම හිතුවා. "දැන් මට වෙච්ච දේවල හැටියට මිනිහාට හෙට වෙන්නෙ මොකක් ද කියලා කාටවත් කියන්ඩ බෑ. ජීවිතේ දුක, සැප දෙකට ම මූණ දෙන්ඩ පුරුදු වෙලා හැදෙන එක තමා මිනිහකුගෙ හරි ගැනියකගෙ හරි වටිනාකම" කියලා.

ඉතින් ඊට පහුව ද හිඟන්නා ගෙදර ඇවිත් කුමාරිට කීවා "ඔන්න සොඳුර, උඹලට ගැළපෙන විදිහෙ වැඩක් මම හොයා ගත්ත, ඒකට ගැනු නුවණක් ඕනෑ කරන්නෙත් නෑ. හුරු පුරුදුකම් ඕනෑ කරන්නෙත් නෑ, මේ රටේ රජ්ජුරුවන්ගෙ මාලිගාවේ මුළුතැන්ගෙයි වැඩට අත්උදව් දෙන එකයි කරන්ට ඇත්තෙ. අපට ජීවත් වෙන්ඩ තරමට දීමනාවක් ලැබෙයි" කියලා. ඉතින් කුමාරි ඒකට ඇලි මැලි කරද්දී බලෙන් ම වාගෙ මාලිගාවට ගිහින් රඳවලා ආවා.

ඉතින් මේ මාලිගාවෙ මුළුතැන්ගෙට ගිය කුමාරිට එහි දී දැනගන්ට ලැබුණා ඒ රජ්ජුරුවන්ගෙ යුවරජ්ජුරුවො ළඟදි කරකාර බඳිනවා කියලා.

ඉතින් මේ කුමාරි මාලිගාවට ගියාට, තිස්සෙ දෙවේලේ සිහි වෙන්නෙ තමන් ගැනමයි. තමන්ගෙ අතීතෙ ගැනයි, දැන් මේ මුළුතැන්ගෙයි මෙහෙකාරකමට වැටුණු හැටියි තමා කුමාරිට හැම තිස්සෙ ම සිහියට එන්නේ. ඉතින් එතකොටත් කුමාරි හිතනවා මේ ඔක්කොම දේ සිද්ද වුණේ මගෙ අහංකාරකම නිසා ම නේද කියලත්. එහෙම හිතලා කුමාරි බොහොම පසුතැවිලි වුණා.

ඉතින් ඊට පහුව ද මේ කුමාරි රජගෙදර තමන්ගෙ ගබඩාවෙ ඉන්න වෙලේ එයාගෙ සුවාමිපුරුෂයා ඒ ගබඩාවට ආව. ඇවිත් ඇහුවා මුළුතැන්ගෙයි වැඩ කිරීම කරදර ද කියලා. ඉතින් මේ කුමාරි කීවා "කරදරයක් නෑ, ඒත් මම කැමතියි වෙන කොහේ හරි ගිහින් බැලමෙහෙ කරන්ඩ ලැබෙනවා නම්" කියලා.

ඉතින් එතකොට මේ සුවාමිපුරුෂයා කීවා "උඹලට මාත් එක්ක ජීවත්වෙන එක කරදරයි. මම උඹලා නිදහස් කරන්නම්. නිදහස් කරලා මේ රටේ රජ්ජුරුවන්ට බාර දෙන්නම්. බාග වෙලාවට රජ්ජුරුවො උඹවත් බිසෝ කෙනෙකු කර ගනීවි. මට ජීවත් වෙන්න සෑහෙන වස්තුවකුත් දෙනවා ඇති. මගෙ ජීවිතේ හැටියට මට උඹලා පිරිමහින්නේ නෑ" කියලා.

ඉතින් එතකොට මේ කුමාරිගෙ දැහින් ම කඳුළු ගලන්ඩ වුණා. ඉතින් කුමාරි කඳුළු සල සලා කීවා "මේ ටික කලින් හිතුව නම් හොඳා. දැන් උඹලා මගේ සුවාමියා


කොයි රජෙකුටත් වැඩියෙ මට මගේ සුවාමියා ලොකු ය, මා දැන් ම මෙතනින් එක්ක යන්ඩ. මම දැන් දන්නවා ලෝකෙ ඉන්න හැටි" කියලා.

ඉතින් සුවාමිපුරුෂයා කුමාරිගෙ අතින් අල්ලලා ළං කර ගෙන ඇගේ ඇස් දෙක දිහා බැලුවා. කුමාරිත් කෙළින් ම සුවාමියාගේ ඇස් දිහා බැලුවා. එතකොට ඒ සුවාමියා තේරුම් ගත්තා කුමාරි මේ කියන්නේ පිරිසිදු හිතක් ඇතුව ම වග. එහෙම හිතාගෙන කුමාරි තමා ළඟින් ඉන්ද ගත්තා. ඉන්දගෙන හීන් සැරේ කනට කර කීවා "ඇයි සොඳුර මා අඳුනාගන්ඩ බැරි වුණා ද? මම තමයි යුව රජ්ජුරුවො. හිඟන්නෙකු වගේ ගිහින් හිඟමන් ඉල්ලුවෙත් මමයි. අශ්වයා පිටේ ගිය භේවායත් මමයි. මෙයාට ලෝකෙ ඉන්න හැටි දැනගන්න උපකාර කළෙත් මම් ම නේ ද?" කියලා කිව්වා.

ඉතින් එතකොට මාලිගාවෙ සේවිකාවෝ ඇවිදින් කුමාරි එක්ක ගිහින් සුවඳ පැනින් නාවලා, සළුපිළී අන්දලා, ආබරණ පලන්දලා යුව රජ්ජුරුවන් ළඟට කැටුව ගියා.

ඉතින් ඊට පස්සෙ පවත්වාපු සරණ මංගල්ලෙට කුමාරිගෙ පිය රජ්ජුරුවොයි, මවු බිසවයි දෙන්නත් ආවා.

## ක්‍රියාකාරකම 01



(i) මේ කතාවේ සඳහන් කුමරියගේ චරිතයේ ප්‍රධාන ලක්ෂණය පැහැදිලි කරන්න.

(ii) **"යුවරජුගේ චරිතයෙන් පිළිබිඹු වන්නේ ඉවසිලිවන්ත පුද්ගලයෙකුගේ ස්වරූපයයි"** මේ පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න.

(iii) **"කුමරියගේ ගතිපැවතුම් වෙනස් කිරීමට යුවරජු අනුගමනය කළ ක්‍රියා මාර්ගය කර්කශ ස්වරූපයක් ගනී"** පක්ෂව හෝ විපක්ෂ ව කරුණු ඉදිරිපත් කරන්න.

(iv) සාහිත්‍යාංගයක් ලෙස ජනකතාවේ ඇති අගය කෙටියෙන් දක්වන්න.

## ක්‍රියාකාරකම 02



**පහත සඳහන් ප්‍රකාශ ඇසුරෙන් දී ඇති වගුව සම්පූර්ණ කරන්න.**

(i) "තමන්ගේ බත තමන් උයා පිහාගෙන කෑම මදිකමක් අවනම්බුවක් නො වෙයි"

(ii) "මේ සුරතලේ තවත් දිගට ගෙනියන්ඩ බෑ"

(iii) "ඔය කාගෙවත් දේ ගැන හිතන්ඩ අයිතියක් නෑ"

(iv) "මිනිසුන් වුණා ම සැප දුක දෙක ම අයිතියි"

(v) "මිනිහාට හෙට වෙන්නෙ මොකක් ද කියල කාටවත් කියන්ඩ බෑ."

| ප්‍රකාශ කළේ කවු ද? | කාහට ද? | කවර අවස්ථාවක ද? |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |
| (v) | | |

## ක්‍රියාකාරකම 03

**පන්තිය කණ්ඩායම් ලෙස බෙදී පහත සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙන්න.**

(i) එක් එක් කණ්ඩායම ජනකතා 02ක් බැගින් සොයා ඉදිරිපත් කරන්න.

(ii) එක් ජනකතාවකින් ඔබ සිත් ගත් අවස්ථාවක් තෝරා ගෙන රඟ දක්වන්න.

## ක්‍රියාකාරකම 04

**පහත දැක්වෙන පදවලට සමානාර්ථවත් පද පාඩමෙන් උපුටා දක්වන්න.**

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රවිෂ්ට වීම | (vi) | දරිද්‍ර |
| (ii) | මුග්ධ | (vii) | උඩඟු |
| (iii) | ප්‍රභාතය | (viii) | අඥෝනා |
| (iv) | සාගින්න | (ix) | තුරඟ |
| (v) | විනාශය | (x) | විවාහ වීම |

**පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පද පාඩමෙන් උපුටා දක්වන්න.**

| | | | |
|---|---|---|---|
| (i) | නිරහංකාර | (vi) | නො ගැළපෙන |
| (ii) | නම්බුව | (vii) | අපිරිසිදු |
| (iii) | ධනවත් | (viii) | දුර |
| (iv) | නිර්භය | (ix) | ගඳ |
| (v) | දුක | (x) | අදක්ෂ |

**පහත සඳහන් (අ) කොටසේ වචනවලට ගැළපෙන පද (ආ) කොටසෙන් තෝරා යුගල පද තනන්න.**

| (අ) | (ආ) |
|---|---|
| සැප | පුරුදු |
| වට්ටි | පය |
| කන | පෙට්ටි |
| අත | දුක |
| හුරු | පිළි |
| ඇලි | මැලි |
| සළු | බොන |

## ක්‍රියාකාරකම 05

**කථා ව්‍යවහාරයෙන් දැක්වෙන පහත සඳහන් ඡේදය ලේඛන ව්‍යවහාරයට හරවා ලියන්න.**

මේ යුවරජ්ජුරුවෝ පහුවද උදේ ම හිඟන්නෙකු වගේ හැරහිලා ඇවිත් කවියක් කියලා හිඟමනක් ඉල්ලුවා. එතකොට රජ්ජුරුවෝ තමන් දිවුරා කියා තුබුණ හැටියට මේ කුමාරිකාව හරහලා ඒ හිඟන්නාට පාවා දුන්නා. ඉතින් මේ වෙච්ච නස්පැත්තිය මොකක් ද කියලා අර කුමාරි අඬන්න වැලපෙන්න පටන් ගත්තා.

## ක්‍රියාකාරකම 06

### අසම්භාව්‍ය ක්‍රියා

යම් ක්‍රියාවක් මඟින් කාලය හෝ අවිනිශ්චිත බව හෝ හැඟවේ නම් එවැනි ක්‍රියා අසම්භාව්‍ය ක්‍රියා වේ. **වැටෙද්දී, ආවොත්** යන ක්‍රියා පද අසම්භාව්‍ය ක්‍රියා ගණයට අයත් වේ. කාලාර්ථය හා අනියමාර්ථය යනුවෙන් අසම්භාව්‍ය ක්‍රියා කොටස් දෙකකට බෙදිය හැකි ය.

- **කුමාරිය ඇලි මැලි කරද්දී බලෙන් ම වගේ මාලිගාවට ගිහින් රඳවලා ආවා.**
  මෙම වාක්‍යයේ සඳහන් **කරද්දී** යන ක්‍රියා පදයෙන් නිශ්චිත කාලයක් කියවේ.
  මෙහි කරද්දී යන ක්‍රියා කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා යනුවෙන් හැඳින්වේ.

- **දුක සැප දෙකට ම මූණ දෙන්න පුරුදු වුණොත් හොඳ බව ස්වාමිපුරුෂයා පැවසුවේ ය.**
  **පුරුදු වුණොත්** යන ක්‍රියාපදයෙන් නිශ්චිත බවක් නො හැඟවෙයි.
  මෙසේ නිශ්චිත බවක් නොමැති ක්‍රියා අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා යනුවෙන් හැඳින්වෙයි.

**ආවොත්, පැන්නොත්, නටද්දී, බලද්දී, අසද්දී** යන ක්‍රියා පද යොදා වාක්‍යය බැගින් ලියන්න.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 07

පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට සුදුසු අසම්භාව්‍ය ක්‍රියා පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) මා විභාගයෙන් උසස් ලෙස සමත් ........................ අම්මා සතුටු වන්නී ය.

(ii) අප විනය ගරුක ව ජීවත් ................................ යහපත් පුරවැසියන් විය හැකි ය.

(iii) කෞෂික පුතා හිමිදිරියේ ම අවදිව පාඩම් ...................................... දෙමාපියෝ අමන්දානන්දයට පත් වූහ.

(iv) අරපරිස්සමෙන් වියදම්............................................ අත මිට සරු වේවි.

(v) කුමරිය ඉවසීමෙන් ක්‍රියා .................................... කුමරු නිහඬ සතුටක් වින්දේ ය.

(vi) ගස මනාව ......................................... අපත් රැකෙයි.

(vii) විදුලිය අරපරිස්සමෙන් භාවිත ..................................... විදුලි බිල අඩුකර ගත හැකි ය.

(viii) වැසි ............................................ ගස් ප්‍රබෝධවත් විය.

(ix) ගෙහිමියන් රූපවාහිනිය .................................... අමුත්තෙක් ගෙදරට පැමිණියේ ය.

(x) සෑම දරුවෙකු ම දෙමාපියන්ට හොඳින් .............................. වැඩිහිටි නිවාස අවශ්‍ය නො වේ.

(වැටුණොත්, රැකුණොත්, වුණොත්, කරද්දී, වුවහොත්, කළහොත්, වසිද්දී, නරඹද්දී, සැලකුවහොත්, වැස්සොත්, දුවද්දී)